# අධික රෝම වර්ධනය (Hirsutism)

ස්ත්‍රී ශරීරයේ පුරුෂයෙකුගේ මෙන් තද වර්ණයෙන් යුත් රෝම වර්ධනය වීම Hirsutism යනුවෙන් හැඳින්වේ.

## 01. මෙහි රෝග ලක්ෂණ මොනවාද?

මෙහිදී උඩුතොල, නිකට, පපුව මැද, උදරයේ (පුරුෂයකුගේ මෙන්) ඝන රෝම දැකගත හැක. මෙම ස්ථානවලට අමතරව කලවා ප්‍රදේශයේ සහ තට්ටම් ප්‍රදේශවලද තද පැහැ රෝම වර්ධනය සිදු විය හැක. මෙම රෝගී තත්ත්වය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන තත්ත්වයක් නොවේ.

## 02. මෙම රෝගයට හේතු සාධක මොනවාද?

- Hirsutism යන රෝගී තත්ත්වයට ප්‍රධාන හේතුකාරකයක් වනුයේ ශරීරයේ Androgen නැමැති හෝමෝනය අධිකව නිෂ්පාදනය වීම හෝ එම හෝමෝනයට ශරීරය ඉතාමත් සංවේදී වීම. (Androgen හෝමෝනය නිෂ්පාදනය වන්නේ ඩිම්බ කෝෂවල සහ අධිවෘක්ක ග්‍රන්ථිවලයි)

- නමුත් මෙම තත්ත්වයට ගොදුරු වූ කාන්තාවන්ගෙන් 25% කට පමණ නිශ්චිත හේතුවක් සොයා ගැනීමට නොහැක. (කාන්තා මුහුණේ සහ අත්පයවල රෝම ගහනය වයසත් සමඟ වැඩිවිය හැක. විශේෂයෙන්ම ආර්තවහරණයෙන් පසුව මෙම තත්ත්වය වඩාත් දැකිය හැකිය.)

- ඔසප් චක්‍රය සක්‍රීය කාන්තාවන්ට මෙම තත්ත්වය බලපාන මූලිකවම හේතුවන්නේ Polycystic Ovarian Syndrome යනුවෙන් හැඳින්වෙන ඩිම්බ කෝෂවල ගැටිති හට ගැනීමේ තත්ත්වයයි.

- මීට අමතරව ඇතැම් ඖෂධ වර්ග (Steroids), ශරීරයේ අනෙකුත් හෝමෝන වර්ගවල අසාමාන්‍යතාවයන් සහ ඉතාමත් කලාතුරකින් හෝමෝනය වැඩිපුර ශ්‍රාවය කරන පටකවල අසාමාන්‍ය වර්ධනයක් නිසාද Hirsutism තත්ත්වය ඇතිවිය හැක.

- Hirsutism රෝග ලක්ෂණ ඇති විට ඉතා ඉක්මනින් වෛද්‍ය උපදෙස් ලබා ගතයුතු අවස්ථා කිහිපයක් ඇත.

එනම්,

1) මල්වර වීමට පෙර Hirsutism තත්ත්වය ඇති වූ විට,
2) ආර්තව චක්‍රයේ වෙනස්වීම් සිදු වු විට,
3) ස්ථූලතාවය සහ දියවැඩියාව යන තත්ත්වයන් සමඟ හඳුනාගත් විට,
4) හිසකෙස් තුනීවීම, තට්ටය පෑදීම, කටහඬ ගොරෝසු වීම සහ ගැඹුරු වීම වැනි ලක්ෂණ ඇති වු විට.

## 03. මේ සඳහා ඇති ප්‍රතිකාර වර්ග මොනවාද?

- පළමුව Hirsutism තත්ත්වය ඇතිවීමට හේතු වූ කරුණු සොයා ඒ අනුව ප්‍රතිකාර කල යුතුය.

- මේ සඳහා හෝමෝන පරීක්ෂණ සහ උදරයේ USS යන පරීක්ෂණ මූලිකවම සිදු කරනු ඇත.

- ශරීරයේ හෝමෝනවල අසාමාන්‍යතාවයක් ඇති බව පරීක්ෂණවලින් තහවුරු වුවහොත් අන්තරාසර්ග පද්ධතිය (හෝමෝන) පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත ඔබව යොමු කරනු ඇත.

- Hirsutism යන තත්ත්වයට ඖෂධීය ප්‍රතිකාරවලට අමතරව වෙනත් ක්‍රම මගින් අධික රෝම ඉවත් කිරීම සිදු කරනු ලබයි.

1) **රෝගියාට තමාටම කරගත හැකි ප්‍රතිකාර ක්‍රම**

i. Shaving **ප්‍රතිකාරය**

අනවශ්‍ය රෝම රේසරයක් ආධාරයෙන් ඉවත් කළ හැක. රේසරයක් ආධාරයෙන් රෝම ඉවත් කිරීම නිසා වැඩිපුර රෝම වර්ධනය වේ යැයි යන්න මිත්‍යා මතයකි. නමුත් නිතර නිතර රෝම Shaving ක්‍රමයෙන් ඉවත් කිරීම නිසා සමේ ආසාත්මිකතාවයක් ඇතිවිය හැක.

ii. Waxing **ප්‍රතිකාර**

ඉටි (Wax) ආධාරයෙන් සමේ අනවශ්‍ය රෝම පහසුවෙන් ඉවත් කළ හැක. නමුත් මුහුණේ අනවශ්‍ය රෝම ඉවත් කිරීම සඳහා මෙම ක්‍රමය නොගැලපේ. Waxing ප්‍රතිකාරය නිසා රෝම කූප ආසාදනය සහ කැළැල් ඇතිවීම අතුරු ආබාධ ලෙස හඳුනා ගෙන ඇත.

iii. Depilatories (රසායනික ද්‍රව්‍ය ආධාරයෙන් අනවශ්‍ය රෝම ඉවත් කිරීම.)

Depilatories මගින් රෝම ඉවත් කිරීමට පෙර එය ඔබේ සමට ගැලපේදැයි තීරණය කිරීමට සංවේදිතා පරීක්ෂණයක් සිදු කිරීම අනිවාර්යය වේ. මෙම ක්‍රමය භාවිතයෙන් පසු කලාතුරකින් සමේ ආසාත්මිකතා ඇතිවිය හැක.

iv. **විරංජන කාරක**

විරංජන කාරක භාවිතයෙන් තද පැහැ රෝම අවර්ණ කිරීම සිදු කරයි. නමුත් මෙම ක්‍රමය කළු හෝ තලෙළු සමට ගැලපෙන ප්‍රතිකාරයක් නොවේ.

2) **වෛද්‍යවරයෙකු විසින් සිදුකරන රෝම ඉවත් කිරීමේ ප්‍රතිකාර**

i) Electrolysis **(විද්‍යුතය භාවිතයෙන් රෝම ඉවත් කිරීම)**

ඉතා සියුම් කටුවක් ආධාරයෙන් විද්‍යුත් තරංග රෝම කූප මුලට එල්ල කිරීමෙන් රෝම කූපය විනාශ කිරීම Electrolysis යනුවෙන් හැඳින්වේ. මෙමගින් රෝම කූපය සම්පූර්ණයෙන්ම විනාශ වේ. මෙම ප්‍රතිකාරයෙන් කැළැල් ඇති වීමේ අවධානමක් පවතී. මෙම ප්‍රතිකාර ක්‍රමයට යොමුවීමට පෙර එය සිදු කරන තැනැත්තා මෙම ප්‍රතිකාර කිරීම සඳහා මනා සුදුසුකම් ලත් අයෙක්ද යන්න සොයා බැලීම වැදගත් වෙයි.

ii) Laser **ප්‍රතිකාර ක්‍රමය**

Laser ප්‍රතිකාරය මගින්ද සිදුකරනුයේ රෝම කූප සම්පූර්ණයෙන්ම විනාශ කිරීමයි. මෙය ප්‍රතිකාර වාර කිහිපයක් අවශ්‍ය වන අතුරු ආබාධ අවම ක්‍රමයකි. (සම රතු වීම, අවපැහැ ගැන්වීම සහ කැළැල් ඇති වීම කලාතුරකින් ඇතිවිය හැකි අතුරු ආබාධ වේ.)

Laser ප්‍රතිකාරය කරන අතරතුර හිරු රශ්මියෙන් ආරක්ෂා වීම (Sun Screen) වැදගත් වන අතර, රෝම ඉවත් කරන අනෙකුත් ක්‍රම වලින් (රේසරයක් ආධාරයෙන් හැර) වැළකිය යුතුය.

3) **ඖෂධීය ප්‍රතිකාර ක්‍රම**

- **Anti Androgens**

Androgen යන හෝමෝනයේ ක්‍රියාකාරීත්වය අවහිර කිරීම හෝ එම හෝමෝනය නිපදවීම අවහිර කිරීම මෙම ඖෂධ මගින් සිදු වේ. සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මාස කිහිපයක් ගතවනු ඇත. ප්‍රතිකාර නැවැත්වූ විට කෙස් වර්ධනය බාලවීම සිදු වේ.

- **Oral Contraceptives**

Androgen හෝමෝන වල ක්‍රියාකාරීත්වය අවහිර කිරීම සඳහාම නිපද වූ උපත් පාලන පෙති Hirsutism යන තත්ත්වයට ප්‍රතිකාර කිරීමටද භාවිතා වේ. පියයුරු වේදනාව, ඔක්කාරය, හිසරදය සහ ආර්තව චක්‍රයන් අතරතුර සිදුවන රුධිර වහනය අතුරු ආබාධ වශයෙන් හඳුනාගෙන ඇත.

- **Cyproterone**

මෙම ප්‍රතිකාරය මගින් Androgen යන හෝමෝනයේ ක්‍රියාකාරීත්වය අවහිර කිරීම සිදු කරයි. (මෙය උපත් පාලන පෙති සමඟ ද භාවිතා කල හැක)

මෙහි අතුරු ආබාධ ලෙස බර වැඩිවීම, විශාදය, ලේ කැටි ගැසීමේ ප්‍රවණතාවක් ඇතිවීම සහ ලිංගික ආශාවල් අඩුවීම හඳුන්වා දිය හැක.

- **Spironolactone**

නියමිත මාත්‍රාවට අනුව ඖෂධය භාවිතා කිරීමෙන් අධික රෝම වර්ධනය පාලනය කිරීමක් සිදු වේ. මූත්‍රා වැඩි වශයෙන් පිටවීම, පියයුරු වේදනාව, ආර්තව චක්‍රයේ අක්‍රමවත් බව සහ කලාතුරකින් අක්මාවේ ක්‍රියාකාරීත්වයටද මෙම ඖෂධය බලපෑමක් ඇති කළ හැක.

- **Finasteride**

ආර්තවහරණය සිදු වූ කාන්තාවන්ට පමණක් මෙම ඖෂධය නිර්දේශ කරනු ලැබේ. මෙමගින් Androgen යන හෝමෝනය නිපදවීම අවහිර කරනු ලබයි.

Anti Androgens අඩංගු ඖෂධ ගර්භණී අවධියේ භාවිතා නොකළ යුතුය. මෙම ඖෂධ ලබා ගන්නා විවාහක කාන්තාවන්ට උපත් පාලන ක්‍රම භාවිතයට නිර්දේශ කෙරේ.